# වැලි මාලිගාව.

සිතුමි සංකලනා ජයකොඩි.



- **කෘතියේ නම :-** වැලි මාලිගාව
- **කතෘගේ නම :-** එම්.ජී.සිතුමි සංකලනා ජයකොඩි
- **කතෘගේ වෙනත් කෘති :-** මිකීගේ දස්කම්
  පුංචි සුරංගනාවි
- **කෘතිය පළ කරන දිනය** :- 2023/11/15
- **කතාව හා චිත්‍ර** :- එම්.ජී.සිතුමි සංකලනා ජයකොඩි
- **කතෘගේ ලිපිනය** :- 210/F,
  පල්ලෙගුන්නැපාන,
  පොල්ගොල්ල.
- **ISBN** අංකය :- ISBN 978-624-206-626-4

# පිදුම.

කුඩා කළ පටන් මගේ හීන වලට
මග පෑදූ මගේ දෙමව්පියන්ටත්,
එම මග එළිය කළ මිණි පහන්
සේ මා සමග සිටි ගුරු
දෙමව්පියන්ටත් ,
මෙම පොත ලිවීමට මට
නන්අයුරින් උපකාර කළ
සියලුම දෙනාටත් මම මෙම
පොත ගෞරවයෙන් පුදමි.

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි

ශෂිකලා සේනාධීර

විදුහල් පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 10 20

# වැලි මාලිගාව.

🌊සිගිති තවම පුංචි ගැහැණු ළමයෙක්.සිගිති හිටියෙ මුහුදු වෙරළ අයිනෙ තිබුණු පුංචි ගෙදරක අම්මයි ,තාත්තයි එක්ක.සිගිති හුගාක් ආසයි මුහුදු වෙරළට වෙලා කාලය ගත කරන්න.ඉතින් සිගිති හැම ඉරිදාවකම අම්මයි තාත්තයි එක්ක මුහුදු වෙරළට එනවා.ඇවිත් සෙල්ලම් කරනවා.



ඉතින් අදත් ඒ වගේම ලස්සන දවසක්,ඉරිදාවක්.ඉතින් වෙනදා වගේම සිගිති උදේ වරුව නිදහසේ ගත කරල  හවස අම්මයි,තාත්තයි එක්ක මුහුදු වෙරළට ගියා.අද මුහුදු වෙරලෙ වෙනදා තරම් කට්ටිය හිටියෙ නැහැ.වෙනදටත් මේ මුහුදු වෙරළට වැඩිය කට්ටිය එන්නෙ නැහැ. “අද නම් හොදයි වැඩිය සෙනගත් නැහැ.දුවට අද හොදට සෙල්ලම් කරන්න පුළුවන්.” තාත්තා කිව්වා .සිගිතිත් ඒ ගැන හුගාක් සතුටු වුණා. සිගිති තාත්තත් එක්ක සෙල්ලම් කරා.එයා වැඩිපුරම කැමති වුණේ වැලි මාලිගා හදන්න. සිගිති බිම ඉදගෙන ලස්සන වැලි මාලිගාවක් හැදුවා.එක එක විදිහෙ සිප්පිකටුවලින් මාලිගාව සැරසුවා.කෝටුවකින් ලස්සන ලස්සන හැඩ දැම්මා.ඇත්තටම සිගිතිගෙ මාලිගාව ගොඩක් ලස්සනට හැදුනා.



සිගිති වෙරලේ ඇවිදලා සිප්පිකටු හොයාගෙන එනකොට එයා දැක්කා තමන් ආසාවෙන් හදපු වැලි මාලිගාව මුහුදු රැල්ලක වදින්න යන්නේ කියලා.එයා හුගාක් බය වුණා.සිගිති සිප්පිකටුත් අතේ තියාගෙන වේගෙන් රැල්ල එන දිහාවට දිව්වා.එකපාරටම සිගිතිව එතන තිබුණු කෝටුවක පැටලිලා වැටුනා.එයගෙ අතේ තිබුන සිප්පි කටු ඇනිල එයාට තුවාල වුණා.සිගිතිට ගොඩාක් රිදුනා. සිගිති හයියෙන් අඩුවා.අම්මයි තාත්තයි දෙන්නම බය වෙලා දුවගෙන ආවා.“අනේ වැටුනා නේද තුවාලත් වෙලා ඔයා ඔහොමම ඉදගෙන ඉන්න.මම බෙහෙත් අරන් එන්නම් .”කියලා තාත්තා ගෙදරට දුවගෙන ගියා.



සිගිති අර වේදනාවත් එක්කම තමන් සතුටින් හදපු ලස්සන මාලිගාව කැඩිලා තියෙනව බලන්න ඒ දිහා දුකෙන් බලද්දි එයා දැක්කේ හරි පුදුම හිතෙන දෙයක්. ඒක තවම කැඩිලා නැහැ.ඒ මාලිගාව ළගම ලස්සන දම් පාට දිලිසෙන සිප්පි කටුවක් තිබුණා.සිගිති ඒක අතට ගන්න යද්දීම ඒ සිප්පි කටුවෙන් ලොකූ එළියක් මතු වුණා.සිගිතිගෙ ඇස් නිලංකාර වුණා. සිගිති ආයෙත් ඇස් ඇරලා බලද්දි එයා දැකපු දෙයින් පුදුමයට පත් වුණා.එයා හදපු මාලිගාව දැන් හරියට ඇත්ත මාලිගාවක් තරමටම ලොකු වෙලා තිබුනා.සිගිති ඒකට ටිකක් ළන් වුණා.



සිගිති මුලදිම ඒකට හුගාක් බය වුණා.ඒක නිසා සිගිති අම්මා ළගට යන්න පිටුපස හැරුනා.පුදුමයි!අම්මවත්, එතන හිටපු අනිත් අයවත් එතන හිටියේ නැහැ.සිගිති අහපවු මාලිගාව දිහා බලද්දි එකපාරටම මාලිගාව ඇතුළෙන් ලොකූ එලියක් එක්කම ලස්සනම ලස්සන සුරංගනාවියක් එළියට ආවා.එයාගෙ ළගින්ම පුංචි සමනල යාළුවෙකුත් ආවා.සිගිති ඇස් පිල්ලම් නොගහ ඒ දිහා බලාගෙන හිටියා.එයා බලපු සුරංගනා කතා වල හිටපු සුරංගනාවියක් තරම්ම මෙයා ගොඩාක් ලස්සනයි.එයාගෙ සමනලයත් කහ පාට ලස්සන සමනලයෙක්.සුරංගනාවිය එයාට ලස්සන කටහඩකින් කතා කළා. “ළමයා ළගට එන්න.ඔයාගෙ නම මොකක්ද?”සුරංගනාවි එහෙම අහද්දී සිගිති එයාට ටිකක් ළන් වුණා.



සිගිතිගෙ බය ටිකක් අඩු වුණ නිසා සිගිති සුරංගනාවියත් එක්ක කතා කරා. “මගේ නම සිගිති.ඔයා කවුද?කොහොමද මේ වැලි මාලිගාව ලොකු වුණේ?” සිගිති කියාගෙන ගියා. “හරි හරි සිගිති ඔයා කලබල වෙන්න එපා.මම ඔයාට ඔක්කොම දේවල් කියන්නම්.මගේ නම වින්කි.මම ජීවත් වෙන්නේ මේ තියෙන ලස්සන දම් පාට සිප්පි කටුවෙ.ඔයා ඉස්සෙල්ලා දැක්කේ ඒ සිප්පිකටුව තමයි.මම මේ සිප්පිකටුවට වෙලා මුහුදේ පාවෙද්දි මට ගොඩක් අනතුරු එනවා.මම ඒ නිසා මට ගොඩබිමේ ඉන්න තැනක් හොය හොය යනවා.එතකොටයි ඔයාගෙ ලස්සන මාලිගාව දැක්කෙ.මගේ මායාවක් නිසයි මේ මාලිගාව මෙච්චර ලොකු වුණේ.”සුරංගනාවි පිළිතුරු දුන්නා.



සිගිති පුදුමයෙන් අහගෙන හිටියා. “එතකොට මගේ අම්මයි මෙතන හිටපු අනිත් අයයි කොහෙද?” සිගිති දුකෙන් වගේ ඇහුවා. “ එයාලා ගැන බයවෙන්න ඕනෙ නෑ.එයාලට ඔයාව නොපෙනෙන විදිහටත්,ඔයාට එයාලව නොපෙනෙන විදිහටත් මම මායාවක් කරා.ඔයා මේ මම දැන් ජීවත් වෙන්න යන අලුත් මාලිගාවෙ නිර්මාතෘ නිසා මම හිතුව ඔයාට විතරක් මේක පෙනෙන්න තියන්න.එතකොට ඔයාට පුළුවන් මාත් එක්ක මේ මාලිගාව පුරාම ඇවිදින්න.” සුරංගනාවිය කිවුවා. “ අනේ වින්කි,මට දැන්මම අම්මා ළගට යන්න ඕනේ.තාත්තාට කියල මගෙ තුවාල වලට බෙහෙත් දාන්නත් ඕනේ . ඒකනිසා මට එන්න බැරි වෙයි.මට සමාවෙන්න.” සිගිති වින්කිට කිවුවා. “සිගිති කරුණාකරල එක පාරක් යමුද?ඔයා කැමති නැද්ද ඔයා හදපු මාලිගාව ඇතුලට ගිහින් බලන්න.” සුරංගනාවිය දුකෙන් මිමිනුවා. “හොදයි එහෙනම් මම එන්නම්කෝ,හැබැයි මට ආයෙත් ඉක්මනට යන්න ඕනේ.” සිගිති කිවුවා.

කොහොමහරි වින්කි සිගිතිව මාලිගාව බලන්න යන්න කැමති කරවගත්තා.මේ දෙන්නම හෙමින් හෙමින් ඇතුලට ගියා.ඒක හුගාක් ලස්සනයි.ඇතුලට ගිය ගමන්ම ලොකු විදුලි බල්බ වලින් හැදුනු සැරසිල්ලක් උඩ එල්ලෙමින් තිබුනා.තව පුටු ,විශාල මේස,ඔරලෝසු වගේ ලස්සන ලස්සන දේවල් ගොඩක් තිබුනා.සිගිතිට අදහගන්න බැරිවුණා තමන් හදපු වැලි මාලිගාව ඇතුළේ මෙච්චර ලස්සන දේවල් තියෙනවා කියලා.එයාට වෙලාවකට මේක හිනයක්ද කියලත් හිතුනා.වින්කි මෙයා එක්ක ඉදගෙන කතාබහ කරා.වින්කි එයා ගැන විස්තර ගොඩක් සිගිතිට කිවා.



සිගිතිටත් ප්‍රශ්න ගොඩයි. “වින්කි,ඔයාට මුහුදෙදි ගොඩක් කරදර ආවානේ.එතකොට ඔයා ඒවගෙන් බේරුණේ කොහොමද?”සිගිති ඇසුවා.”ඔව් සිගිති,මට කරදර නම් ගොඩක් ආවා.ඒත් මගේ සමනල් යාළුවා,යෙලෝවි මාව ඒ හැම තැනකදිම බේරා ගත්තා.එයාට ඕනෙ වුණහම ලොකු වෙන්න පුලුවන් මමත් එයට කරුණාවන්ත වුණ නිසාම තමයි යෙලෝවිත් මට උදවු කළේ.”වින්කි යෙලෝවිව අතට ගන්න ගමන් කීවා. සිගිති වින්කිත් එක්ක ගොඩක් හිතවත් වුණා.එයාට මාලිවෙ ඉද්දි වෙලාව යනවවත් දැනුනෙ නැහැ.සිගිතිට ටික වෙලාවකින් තමයි මතක් වුණේ ගෙදර යන්න ඕනෙ කියලා. “වින්කි ,මට දැන් ගෙදර යන්න වෙනවා.දැනටමත් අම්මායි,තාත්තයි මාව හොයනවා ඇති.”සිගිති  වින්කිට කතා කරලා කිව්වා. “අනේ සිගිති ඔයාට තව ටිකකින් යන්න බැරිද?ඔයා ගියහම අපි දෙන්නා තනි වෙනවනේ.” වින්කිත් යෙලෝවිත් දෙන්නම සිගිති දිහා දුකෙන් බලාගෙන හිටියා.  “හරි හරි මම ගියාට මුහුදු වෙරළට ගොඩක් අය එනවා යනවා.අනික මමත් හෙට එන්නම්කෝ.” සිගිති වින්කිගේ හිත සැනසුවා.



සිගිති මේ විදිහට වින්කිගෙන් සමුගෙන යන්න කියල යද්දිම එකපාරටම මාලිගාව හෙල්ලෙන්න ගත්තා.හෙල්ලිල හෙල්ලිල කැඩිල වැටුණා.ඒ එක්කම සිගිතිවයි වින්කිවයි මුහුදට ගහගෙන ගියා.යෙලෝවිවත් එකපාරටම ඈතට වේගෙන් පාවෙලා ගියා.එතකොටයි එයාලට මොකද වෙලා තියෙන්නෙ කියල තේරුණේ.වින්කි මැජික් එක කරේ මාලිගාව ලොකු වෙන්න කියලනෙ.ඒත් වෙලා තියෙන්නෙ ඒකෙ අනිත් පැත්ත.ඇත්තටම වෙලාතියෙන්නේ වින්කියි සිගිතියි පොඩි වෙලා! “අනේ මට සමාවෙන්න සිගිති, මගෙ වැඩ නිසා ඔයත් අමාරුවෙ වැටුණා.” වින්කි මුහුදු රැලි එක්ක පොර බදින ගමන් කිව්වා. “දැන්ඒක ගැන නෙමෙයි මේකෙන් ගැලවෙන එක ගැන හිතමු.”සිගිති අමාරුවෙන් මුහුදෙ පීනන ගමන් වින්කිට කතා කරා.



එයාලා ගොඩ වෙලාවක් මුහුදෙ අමාරුවෙන් පීනුවා.  වින්කිට අදහසක් ආවා.වින්කි තමන්ගේ මායා බලෙන් රැල්ල අඩු කරන්න උත්සහ දැරුවා.ඒක හරි ගියා!දෙන්නටම ගොඩාක් සතුටුයි.ඒත් ප්‍රශ්නයක්! දැනටමත් එයාල මුහුදේ ගොඩක් දුරට ඇවිත්.ආයෙත් එයාලට ගොඩක් දුර පීනන්න වෙනවා.එයාල අමාරුවෙන් පීනගෙන පීනගෙන යද්දි එයාලට යෙලෝවිව දැකගන්න ලැබුණා යෙලෝවි ලොකුවෙලා සිගිතිවයි වින්කිවයි අරගෙන පියාඹලා එයාල හිටපු වෙරළටම අරගෙන ගියා.ඒත් එයාල තවමත් පොඩියි.වින්කි තවමත් ලොකුවෙන්න කියන මන්තරය දන්නෙ නැහැ.සිගිති ඒත් තමන්ගෙ ආදරණීය අම්මවයි තාතවයි හොයාගෙන අමාරුවෙන් හරි ගෙදර ළගට ගියා.වින්කිත් යෙලෝවිත් එයත් එක්ක ආවා.ගෙදරට යද්දි අම්මයි තාත්තයි සිගිති නැතුව ගොඩක් දුකින් හිටියා.සිගිති ගේට්ටුව ළග හිටියත් අම්මටයි තාත්තටයි එයාව පෙනුනේනම් නැහැ.

සිගිතිට අම්මටයි තාත්තටයි තමන් ඉන්න බව අගවන්න හොඳ අදහසක් ආවා. “වින්කි, යෙලෝවි ,මට හොද අදසක් ආවා.හැබැයි ඒකට මට ඔයාලගෙන් උදවු ඕනේ.” සිගිති තමන්ගෙ යාළුවොන්ගෙන් උදවු ඉල්ලුවා.ඒයාලත් ඒකට කැමති වුණා.සිගිති ගිහින් මිදුලෙ තිබුනු එයා ආසම ඔන්චිල්ලාවට නැග්ගා.යෙලෝවිත්,වින්කිත් දෙපැත්තෙ ඉදලා ඒක පද්දන්න ගත්තා.අම්මයි තාත්තයි මේ ඔන්චිල්ලාව ඉබේම පැද්දෙනවා දැක්කා.එතකොටම ඒ ඔන්චිල්ලාව උඩ මොකක් හරි දෙයක් හෙලවෙනවා වගෙත් දැක්කා.එයාල ගිහින් බලද්දි දැක්කා ඒ එයාලගෙ දුව කියලා.ඒ දෙන්නා ගොඩක් සතුටු වුණා සිගිතිව දැකල. “දුව ඔයාට මොකද වුණේ අපි හුගක් බය වුණා.ඒත් මොකද මේ පොඩි වෙලා?එතකොට කවුද මේ උඩ ඉන්න දෙන්නා?”අම්මා සිගිතිව අතට ගන්න ගමන් කිව්වා. “මොනවා වුණත් ඔයා දැන් නිකන් තම්බලීනා වගෙයි.”තාත්තා සිගිතිගෙ ඔලුව අතගාන ගමන් කිව්වා.



සිගිති එයාට වුණ කතාව අම්මටයි තාත්තායි කිව්වා.එයාල වින්කිටත් යෙලෝවිටත් තමන්ගෙ දුවව බලාගත්තට ස්තූති කළා.ඊටපස්සේ සිගිතිගෙ අම්මා වින්කිටයි සිගිතිටයි ලස්සන පුංචි ඇදුම් කට්ටල මහලා දුන්නා.ඒවා ගොඩාක් ලස්සනයි.මොනවා වුණත් සිගිතිගෙ අම්මයි තාත්තයි සිගිතිගෙ මේ කුඩා වීම ගැන ගොඩක් දුක් වුණා.සිගිතිට වින්කිවත් යෙලෝවිවත් ගෙදර තියාගන්න ඉඩ ලැබුණා.ඒත් අම්මල ගෙදරින් ගියහම එයාලට තනියම වැඩ කරගන්න අමාරු වුණා.ඒ නිසාම වින්කි , සිගිතිටයි තමන්ටයි මුහුදෙ ඉන්න පුලුවන් වෙනවිදිහෙ මැජික් එකක් කරා.ඊටපස්සේ අම්මලා වැඩට යන වෙලාවට එයාල මුහුදෙ කොරල් පර අස්සෙ ආරක්ෂාකාරී තැනක් හදාගත්තා සෙල්ලම් කරන්න.එයලා එතන ගොඩක් සතුටින් කාලය ගත කළා.ආයෙත් අම්මා ආවහම ගෙදර ගියා.

🌊ඔයාලට අදටත් මුහුදුවෙරලට ගිහින් හොදට මුහුදෙ හඩට කන්දුන්නොත් සිගිතියි,වින්කියි මුහුද ඇතුළෙ සෙල්ලම් කරන හඩ ඇසේවි. ✨

**<u>නිමි.</u>**



# පසුවදන

නුතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණී මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20